# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,931 — 1964 ජනවාරි 24 වැනි සිකුරාද — 1964.1.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 121 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 126 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 129 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 136 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 136 | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

## විශේෂ නිවේදනයයි

1964 ජනවාරි 28 වැනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1964 ජනවාරි 31 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1964 ජනවාරි 25 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1964 ජනවාරි 17 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

6. දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරු වලට ඉල්ලුම්පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කායසී සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදාහැරීමට තමන් සූදානම්ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතුයි.

7. අයදුම් පත් ලැබුණු බව දන්වනු ඇත. අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනයේ සිට සත් දිනක් ඇතුළත තම අයදුම් පත ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවකු වෙත් නම්, වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

සී. ජේ. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන්,
සභාවේ ලේකම්,

1964, ජනවාරි මස 20 වැනි දින,
කොළඹ 1, ගාළු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායසීලයේ දීය.
තැ. පෙ. 500.

1–825—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඊ.එස්. 457/63.

## කොළඹ වරාය කොමිෂන් සභාව

### "ස්වයංධාවන" හොපර්බාජ් යාත්‍රාවේ උප නැව් නිලධාරි තනතුර

කොළඹ වරාය කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ "සවයංධාවන" හොපර්බාජ් යාත්‍රාවේ උප නැව් නිලධාරි තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම් පත් 1964 පෙබරවාරි 17 වැනි දින හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුර සඳහා රු. 1,980න් පටන් ගෙන රු. 120 වාර්ෂික වැඩිවීම් 11 කින් රු. 3,300 දක්වා නගින වැටුප් ක්‍රමයක් නියැමිතය.

3. **වයස.**—සෑම අයදුම්කරුවෙකුම අයදුම් පත් භාරගන්නා අන්තිම දිනට අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම තමාට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) "කෝස්ට්වයිස් ව්රේඩ්" හි උප නැවියකු (Mate) වශයෙන් ප්‍රවීණතාවය ලබා ඇති බවට සහතිකයක් තිබීම;

(බී) විශිෂ්ඨ චරිතයක් හා යහපත් සෞඛ්‍ය තත්ත්වයක් ඇති බව ;

(සී) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වී සිටින අය ගැන වැඩි සැළකිලි දක්වනු ලැබේ.

5. සෑම අයදුම්කරුවෙකුටම පහත සඳහන් සහතික සියල්ලම හෝ ඒවායින් ඕනෑම එකක් හෝ ඉදිරිපත් කිරීමට පිළිවන් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාසැල් පිළිබඳ රෙගුලාසි සංග්‍රහයේ කටයුතු සඳහා නිකුත් කරන ලද සහතික පත් භාරගනු නොලැබේ.)

(බී) උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික.

(සී) "කෝස්ට්වයිස් ව්රේඩ්" හි උප නැවියකු (Mate) වශයෙන් ප්‍රවීණතාවය ලැබීම පිළිබඳ සහතිකය.

(ඩී) සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

(ඊ) චරිත සහතික දෙකක්.

6. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—(i) තනතුර ස්ථිර වුවද විශ්‍රාම වැටුප් රහිත එකකි.

(ii) සාර්ථක අයදුම්කරු තුන් අවුරුද්දක සෝදිසි කාලයකට භාජනය කරනු ලැබේ. ඔහුගේ සේවය අසතුටුදායක බව පෙනී ගිය හොත්, සෝදිසි කාලයේදී හෝ එය අවසානයේ හෝ ඔහුගේ සේවය නතර කරනු ලැබේ.

(iii) තෝරා පත් කරගනු ලබන අයදුම්කරුට කෙටි දැනුම්දීම කින් පත්වීම භාරගැනීමට සිදුවනු ඇත.

iv) තෝරා පත්කරගනු ලබණ අයදුම්කරුට දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සිදුවනු ඇත.

(v) යාත්‍රාව පිටවරායවල සේවයේ යොදනු ලබණ විට තෝරාපත් කරගනු ලබණ අයදුම්කරුට යාත්‍රාවේ නැවතී සේවය කිරීමට සිදුවනු ඇත.

7. මෙම තනතුර සඳහා තමාට ඇති සුදුසුකම් හා තමාගේ චරිතය සම්බන්ධයෙන් මෑතකදී ලබාගත් සහතික පත් 3ක් වත් සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුවේ.

8. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ වෙනත් ලියකියවිලි හෝ වරාය කොමිෂන් සභාවේ ඉංජිනේරු මාණ්ඩලික අංශයේ වරාය කොමසාරිස් වරයා වෙත එවිය යුතු අතර, දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරිය කුට පෞද්ගලිකව නොඑවිය යුතුයි.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භ යේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධ යෙන් අදාලවන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

අ. ත. සී. කුලසිංහ,
වරාය කොමසාරිස් වෙනුවට.

1964 ජනවාරි 13,
කොළඹ, වරාය කොමිෂන් සභා කායසීලයේ දීය.

### අයදුම් පත් ආකෘතිය

1. නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් යාකළ යුතුය) :————.
4. අයදුම්කරු වරාය කොමිෂන් සභාවේ සේවකයෙක් නම් විස්තර :————.
5. අධ්‍යාපනික සුදුසුකම් :————.
6. වෘත්තීය සුදුසුකම් :————.
7 පුහුණුව :————.
8. පළපුරුද්ද (විස්තර සඳහන් කළ යුතුය) :————.
9. නිවේදනයේ සඳහන් සම්පූර්ණ සුදුසුකම් ඔබට තිබේද?
10. සහතික පත් දී ඇති අයගේ නම් සහ ලිපිනයන් :—

මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම සහතික කරමි. මෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි සහගත දෙයක් සඳහන් කර තිබෙණ බව තෝරාපත් කර ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා පත් කරගැනීමෙන් පසුව ඒ බව දැන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය: ————.

1–596—64.1.24 දිනා අංක 13,931 දරනු ගැසට් පත්‍රය

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව—බලයලත් නිලධාරීන්ගේ තනතුරු—(ස්ථිර සහ තාවකාලික)

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතියේ ප්‍රකාර පිළියෙල කළ යුතු ඉල්ලුම්පත් 1964 පෙබරවාරි 15 වැනි දිනට හෝ ඊට ප්‍රථම මා වෙත ලැබෙන සේ එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "බලයලත් නිලධාරීන්ගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය" යි සඳහන් කළ යුතුයි.

2. **වැටුප් :** මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය රු. 1,980න් ආරම්භව රු. 120ක වාර්ෂික වේතනාධික 16 ක් ද, රු. 180ක වාර්ෂික වේතනාධික 7ක් ද ඇතිව රු. 5,160න් කෙළවර වේ. (රු. 3,180 සහ රු. 4,620 සීමාවන්ට කලින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ඇත).

3. **සුදුසුකම් :** සෑම ඉල්ලුම් කරුවෙකුම—

(අ) උසස් පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන සුදුසුකම් ලබා සිටිය යුතුයි :

**සටහන : 1**—පහත සඳහන් සුදුසුකම් ඇති රජය යටතේ අවුරුදු 5ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කරති රජයේ සේවකයින්ටද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය :—

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය, හෝ

(ii) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් ලබා ගත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ), හෝ

(iii) ඊට සම සහතික පත්‍රයක්.

**සටහන : 2**—සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අපේක්ෂක සින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ ඊට සමාන විභාගයකදී සිංහල භාෂා විෂයයෙන් නැතහොත් ඊට සම විෂයකින් සමත් වී සිටිය යුතුය.

(1961.1.1 වැනි දිනට පෙර දිනක සිට රජයේ සේවයේ නියුක්තව සිටි අයට මෙම අවශ්‍යතාවය අදාළ නොවනු ඇත.)

(ආ) 1964 පෙබරවාරි මස 15 වන දිනට තම වයස අවුරුදු 21 ට නොඅඩු හෝ 35ට නොවැඩි විය යුතුය.

4. **සේවා කොන්දේසි :**

(අ) තෝරාගනු ලබන අයදුම්කරු ප්‍රථමයෙන් තුන් අවුරුද්දක ආධුනික/පරීක්ෂණ කාලයකට යටත් කොට පත් කරනු ලැබේ. දැනට විශ්‍රාම වැටුප් හිමි තනතුරු දරණ රජයේ සේවකයින් නියමිත කාලයක් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරු ලංකාවේ හෝ දකුණු ඉන්දියාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුයි.

5. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

වී. ටී. ජයසිංහ,
වැඩබලන ආගමන හා විගමන පාලක.

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 586, ගල් බොක්ක, කොළඹ 1,
1964 ජනවාරි මස 16 වැනි දින දීය.

ඉල්ලුම් පත්‍රය

### බලයලත් නිලධාරීන්ගේ තනතුර (ස්ථිර සහ තාවකාලික) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, ගල් බොක්ක, කොළඹ 1

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය සහ උපන් ස්ථානය :————.
4. උපන් දිනය සහ වයස :————.
5. විවාහකද, අවිවාහකද යන වග :————.
6. අධ්‍යාපන සුදුසුකම් : (දැන්වීමෙහි 3 වැනි වගන්තියේ 2 සටහන ප්‍රකාර සිංහල භාෂාමය සුදුසුකම් ලබා තිබේදැයි අමතර වශයෙන් සඳහන් කරන්න). ————.
7. ඉල්ලුම්කරුට කථා කිරීමට, හෝ කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :————.
8. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූ දා සිට කළ රක්ෂාවල් :————.
9. දැනට කරන රක්ෂාව :————.
10. රජයේ සේවයේ යෙදී සිටිනම් (සේවා කාලයත් එහි විස්තරත්) : ————.
11. ඔබගේ ඉල්ලුම්පතට ආධාරවන විශේෂ කරුණු ඇත්නම් (වෘත්තීය සුදුසුකම් හෝ වෙළඳ ව්‍යාපාර ගැන පලපුරුද්ද) :————.
12. ඉල්ලුම්කරුගේ හැකියාවන් සහ චරිතය පිළිබඳව කරුණු ලබා ගතහැකි, සැලකිය යුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනය :————.
13. සහතික :————.
(මෑතකදී ලබාගන්නා ලද සහතික දෙකක පිටපත් අමුණන්න. මුල් පිටපත් නොඑවිය යුතුය. නමුත් සම්මුඛ පරීක්ෂණයට කැඳවුවහොත් ඒවා ඉදිරිපත් කළ යුතුය.)

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය : 1964————.

1–668—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

---

## තාවකාලික ලඝු ලේඛකයින්ගේ තනතුරු

මෙම දෙපාර්තමේන්තුවේ ඉංග්‍රීසි ලඝු ලේඛකයින්ගේ (පහළ ශ්‍රේණියේ) තනතුරු කිහිපයක් සඳහා විශ්‍රාම ලත් රජයේ ලඝු ලේඛකයන්ගෙන් (පහළ ශ්‍රේණියේ) අයදුම් පත් කැඳවනු ලැබේ.

**මෙම තනතුරු සම්පූර්ණයෙන්ම තාවකාලික හා විශ්‍රාම වැටුප් රහිත වේ.**

පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ පිළියෙල කළ යුතු අයදුම් පත් 1964 පෙබරවාරි මස 3 වන හෝ ඊට පෙර කොළඹ 3, පහළ වැව පාරේ කම්කරු කොමසාරිස්තුමා වෙත ලැබිය යුතුය.

2. **ගෙවනු ලබන වැටුප.**—නැවත සේවයෙහි යෙදවීමේදී ගෙවනු ලබන වැටුප් අංක 538 හා 1961.5.27 දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයෙහි විධිවිධාන අනුව තීරණය කරනු ඇත.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම පත්වීම් සම්පූර්ණ වශයෙන්ම තාවකාලික හා විශ්‍රාම වැටුප් රහිත වනු ඇත.

එන්. එල්. අබේවීර,
කම්කරු කොමසාරිස්.

1964 ජනවාරි මස 17 වන දින,
කොළඹ, කම්කරු දෙපාර්තමේන්තුවේදී ය.

ආදර්ශ ඉල්ලුම් පත්‍ර ආකෘතිය

### ඉංග්‍රීසි ලඝුලේඛක (පහළ ශ්‍රේණියේ)—(සම්පූර්ණයෙන්ම තාවකාලික හා විශ්‍රාම වැටුප් රහිතයි) තනතුරු සඳහා අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. වයස හා උපන් දිනය :————.
4. විශ්‍රාම ගත් දිනය හා හේතුව :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–714—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

(අ) ඉල්ලුම් කරු :———.
(ආ) ඇගේ පියා :———.
(ඇ) ඇගේ පියාගේ පියා :———.
(ඈ) ඇගේ පියාගේ පියාගේත් පියා :———.

6. අධ්‍යාපන සුදුසුකම් හා ඒවා ලබාගත් දින (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපපත් ඇමිණිය යුතුයි) : ———.

7. වෘත්තීය සුදුසුකම් :———.

8. ඉගෙනීම ලැබූ පාසැල් හා විද්‍යාල (ඇතුළත් වූ හා අස්වූ දින සඳහන් කළ යුතුයි) :———.

9. ඉගැන්වීමේ පළ පුරුද්ද (මෙහි පහත දැක්වෙන ෆෝර්මයෙහි විස්තර සඳහන් කරන්න) :———.

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුළත්වූ දිනය | අස්. වූ දිනය | දූරූ තනතුර | සේවාකාලය අ.මා.ද. | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |

මුළු ගණන :———.

10. දෙමළ භාෂාවෙන් ලබා ඇති සුදුසුකම් :———.

11. චරිත සහතික ලබා ගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිල (සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.) :———.

12. වෙනත් විස්තර :———.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් හෝ සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරා ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුනහොත්, කිසිම වන්දි ගෙවීමක් නොමැතිව, මා රාජකාරියෙන් පහ කර දැම්මට යටත් වන බවද මම දනිමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

1–701—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

---

අංක : ඇස්. එච්. 332/60.

## නිදෙස් කිරීම

### පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල් යාන්ත්‍රිකයින් බඳවා ගැනීම

1964 ජනවාරි මස 17 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ II වැනි ඡේදයේ I වැනි කොටසේ 104 වැනි පිටුවේ දක්වෙන ඉහත සඳහන් මැයෙන් යුත් නිවේදනයේ 4 (ඇ) වැනි ඡේදය කෙරෙහි සැලකිල්ල යොමු කරනු ලැබේ.

2. ඉහත කී තනතුරු සඳහා ඉල්ලුම්කරන්නවුන් විසින් පිළිගත් මෝටර් ඉංජිනේරු සමාගමක හෝ වෙනත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ සාර්ථක ලෙස සම්පූර්ණ කර සිටිය යුත්තේ 4 අවුරුදු කාලයක ආධුනිකත්වයක් මිස, එම නිවේදනයෙහි වැරදීමකින් සඳහන් කර ඇති පරිදි 21 අවුරුදු කාලයක ආධුනිකත්වයක් නොවන බැව් මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන සියළුම ඉල්ලුම්කරුවන් විසින් සැලකුව මැනවි.

සැ. ආ. දිසානායක,
පොලිස්පති.

1964 ජනවාරි 22 වැනි දින,
කොළඹ 1, පොලිස් මූලස්ථානයේදී ය.

1–872—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ප්‍රායෝගික ගොවි පාසැල්— පුහුණුවීමේ වර්ෂය 1964–65

පහත සඳහන් ගොවි පාසැල් සියල්ලෙහි 1964–65 පුහුණුවීමේ වර්ෂය 1964, අප්‍රේල් 20 වන දිනයෙන්, ආරම්භ වෙයි. මෙම පාසැල්වලට ඇතුල්වීමේ ඉල්ලුම් පත් 1964, පෙබරවාරි 22 වන දින තෙක් භාරගනු ලැබෙ.

අයදුම්කරුවන්ට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුවේ:—

(i) 1964, අප්‍රේල් 20 වන දිනට ඔවුන්ගේ වයස 16ත් 22ත් අතර විය යුතුය.

(ii) ඔවුන් ජ්‍යෙෂ්ඨ විභාගය හෝ පොදු සහතික පත්‍ර විභාගය සිංහල/ දෙමළ, ගණිතය හා අඩු වශයෙන් වෙනත් විෂයයන් තුනකින් සමත්වී සිටිය යුතු වේ.

(පොදු සහතික පත්‍ර විභාගයේදී කෘෂිකර්මයෙන් හා වෙනත් විද්‍යා විෂයයන්ගෙන් සමත්වූ සහ තරුණ ගොවි සමාජවල ක්‍රියාකාරී සාමාජික සාමාජිකාවන් වන අයදුම් කරුවන්ට වැඩි කැමැත්තක් දක්වනු ලැබෙ).

ඇතුළත් වීමට පතන පාසැලේ නම සඳහන්කර පේරාදෙණියේ කෘෂිකර්ම අධ්‍යාපනය හා ගොවිපල් පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂගෙන් අපේක්ෂකයින් විසින් ප්‍රවේශ පත්‍රිකා ලබා ගත යුතුය.

මෙම අභ්‍යාස පංති පවත්වනු ලබන්නේ ගොවිතැනෙහි යෙදීමට අදහස් කරන අයගේ ප්‍රයෝජනය සඳහාය. පුහුණුවීමෙන් පසු රජයේ රැකියාවල් ලබා ගැනීමේ බලාපොරොත්තුවක් තබාගත යුතු නොවේ.

| | පාසැල් පිහිටි ස්ථානය | | කුමන දිස්ත්‍රික්කයන් සඳහාද යන්න | | මාධ්‍යය |
|---|---|---|---|---|---|
| 1. | මාපලාන | ... | මාතර හා හම්බන්තොට | ... | සිංහල |
| 2. | ලබුදූව | ... | ගාල්ල ... | ... | සිංහල |
| 3. | හොරණ | ... | කළුතර ... | ... | සිංහල |
| 4. | අඹේපුස්ස | ... | කොළඹ ... | ... | සිංහල |
| 5. | වාගොල්ල | ... | කෑගල්ල ... | ... | සිංහල |
| 6. | කරපිංච | ... | රත්නපුර ... | ... | සිංහල |
| 7. | බිබිලේ | ... | බදුල්ල. මොණරාගල හා අම්පාරේ | | සිංහල |
| 8. | පැල්වැහැර | ... | නුවර, මාතලේ හා නුවරඑළිය | ... | සිංහල |
| 9. | වාරියපොල | ... | කුරුණෑගල හා හලාවත පුත්තලම | | සිංහල |
| 10. | මහ-ඉලුප්පල්ලම | } | අනුරාධපුරය හා පොළොන්නරුව | | සිංහල |
| 11. | අනුරාධපුරය | } | | | |
| 12. | කිලිනොච්චි | ... | යාපනය ... | ... | දෙමළ |
| 13. | වව්නියා | ... | වව්නියා හා මන්නාරම | ... | දෙමළ |
| 14. | කරඩියන්ආරු | ... | මඩකලපුව, ත්‍රිකුණාමලය හා අම්පාරේ ... | ... | දෙමළ |

ගැහැණු පාසැල් :

| | පාසැල් පිහිටි ස්ථානය | | කුමන දිස්ත්‍රික්කයන් සඳහාද යන්න | | මාධ්‍යය |
|---|---|---|---|---|---|
| 1. | ලබුදූව | ... | ගාල්ල මාතර හා හම්බන්තොට | ... | සිංහල |
| 2. | වල්පිට | ... | කොළඹ, නුවර, මාතලේ කුරුණෑගල, හලාවත-පුත්තලම අනුරාධපුර හා පොළොන්නරුව | ... | සිංහල |
| 3. | බටන්ගල | ... | කෑගල්ල හා රත්නපුර | ... | සිංහල |
| 4. | බණ්ඩාරවෙල | ... | බදුල්ල, නුවරඑළිය, මොණරාගල, හා අම්පාරේ | ... | සිංහල |
| 5. | තින්නවෙලි | ... | යාපනේ, මන්නාරම, වව්නියා ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාරේ ... | ... | දෙමළ |

ඒ. ටී. ඇම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය,
1964.1.10 වනා දින.

1–654—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

කී. 33/3/63.

## ලංකා පරිපාලන සේවය

1963 අප්‍රේල් මස 27 වැනි දිනැති අංක 13,617 දරණ ලංකාණ්ඩුවේ (අති විශෙෂ) ගැසට් පත්‍රයේ පළ කරන ලද ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ, 10 වැනි හා 23 වැනි ඡෙදවල සඳහන් තරඟ පාඨ පරීක්ෂණ පිළිබඳ නිර්දේශ පත්‍රිකා සහ 23(ii) හා 24 වැනි ඡෙදවල සඳහන් ලිපිකාර සේවා සහ දෙපාර්තමේන්තු ශ්‍රෙණිද ප්‍රසිද්ධ කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියෝග කර ඇත.

සී. සේරසිංහ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1964 ජනවාරි මස 20 වැනි දින,
කොළඹ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍ය්‍යාලයේදිය.

### (අ) කොටස—නිර්දේශ පත්‍රිකාව

### 10 වැනි ඡෙදය යටතේ සඳහන් තරඟ පාඨ පරීක්ෂණය

අපේක්ෂකයින් විසින් පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතුය:— ලකුණු

(1) රචනය (පැය තුනයි) ... ... ... ... ... ... ... 150

සාමාන්‍ය මාතෘකාවක් තර්කානුකූලව හා මනාව අවබෝධ වන පරිදි සාකච්ඡා කිරීම සඳහා අපේක්ෂකයින් සතු ප්‍රකාශන ශක්තිය හා හැකියාව රචනයෙන් පරීක්ෂා කරනු ලැබේ. තෝරා ගැනීම සඳහා මාතෘකා දෙනු ලැබේ.

(2) සාරාංශ ලිවීම (පැය එකයි) ... ... ... ... ... ... 50

(3) වත්මන් තොරතුරු (පැය තුනයි) ... ... ... ... ... ... 100

සංස්කෘතික, සමාජ, ආර්ථික, දේශපාලන හා විද්‍යාත්මක කටයුතු වැනි සාමාන්‍ය ප්‍රයෝජනය සඳහා ඉවහල් වන හා වැදගත් වත්මන් කරුණු පිළිබඳව මෙම ප්‍රශ්න පත්‍රය සකස් වනු ඇත.

(4) සාමාන්‍ය ප්‍රශ්න පත්‍රය (පැය තුනයි) ... ... ... ... ... ... 100

වැදගත් හා වැදගත්කමෙන් අඩු දේවල් හඳුනා ගැනීමේ හැකියාව, ප්‍රතිවිපාක වටහා ගැනීමේ දක්ෂතාවය හේතු දක්වීමේ හැකියාව, පරීක්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. ඉලක්කම් පාවිච්චිය හෝ සංඛ්‍යා ලේඛන හා සූචිත ලේඛන තේරුම් කිරීමත් මෙම ප්‍රශ්නවලට අඩංගු වනු ඇත.

(5) රාජ්‍ය පාලනය (පැය දෙකයි) ... ... ... ... ... ... 100

මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් කරුණුවලින් සමන්විත වේ. ලංකාවේ රාජ්‍ය පාලන කටයුතු සකස් කරෑති පිළිවෙල සහ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ ක්‍රියාකාරිත්වය, ලංකා ආණ්ඩු ක්‍රමය, පළාත් පාලනය, පරිපාලන නීතිය, බලය පවරන ලද ව්‍යවස්ථා, ජනසතු කර්මාන්ත සංවිධානය කිරීම සහ අනිකුත් මහජන සේවා

(6) වාචක පරීක්ෂණය ... ... ... ... ... ... ... 200

සම්මුඛ පරීක්ෂක මණ්ඩලය විසින් නිලධාරීන්ගේ සේවා වාර්තාවද සලකා බලනු ඇත.

### 23 වැනි ඡෙදයේ සඳහන් සීමිත පාඨ පරීක්ෂණය

අපේක්ෂකයින් විසින් පහත සඳහන් විෂයයන්ට පෙනී සිටිය යුතුය :—

**අනිවාර්‍ය්‍ය විෂයයන්**

(1) රචනය (පැය දෙකයි) ... ... ... ... ... ... ... 150

සාමාන්‍ය මාතෘකාවක් තර්කානුකූලව හා මනාව අවබෝධ වන පරිදි සාකච්ඡා කිරීම සඳහා අපේක්ෂකයින් සතු ප්‍රකාශන ශක්තිය සහ හැකියාව රචනයෙන් පරීක්ෂා කරනු ලැබේ. තෝරා ගැනීම සඳහා නියමිත මාතෘකා 4 හෝ 5ක් දෙනු ලැබේ.

(2) සාරාංශය ලිවීම (පැය එකයි) ... ... ... ... ... ... 50

මෙම ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තුවන්නේ, ගද්‍ය රචනා එකක හෝ වැඩි ගණනක හරය ඉතා පැහැදිලිව ප්‍රකාශ කිරීම සඳහා අයදුම්කරුවන්ගේ හැකියාවය.

(3) වත්මන් තතු (පැය එකයි) ... ... ... ... ... ... 100

(4) සාමාන්‍ය දැනීම (පැය දෙකයි) ... ... ... ... ... ... 100

සංස්කෘතික, සමාජ, ආර්ථික, දේශපාලන හා විද්‍යාත්මක කටයුතු වැනි සාමාන්‍ය ප්‍රයෝජනය සඳහා ඉවහල්වන හා වැදගත් වත්මන් කරුණු පිළිබඳව මෙම ප්‍රශ්න පත්‍රය සකස්වනු ඇත.

(5) විශේෂයෙන් වර්තමාන ලංකාව ආශ්‍රිතව, ලංකාවේ සමාජ, දේශපාලන හා ආර්ථික සංවර්ධනය (පැය දෙකයි) ... 100

(6) වාචක පරීක්ෂණය ... ... ... ... ... ... ... 200

වාචක පරීක්ෂණයට කැඳවනු ලබන්නේ, ලිඛිත පරීක්ෂණයට ලකුණු සියයට 40ක් ලබාගත් අපේක්ෂකයින් පමණි.

**වෛකල්පික විෂයයන්**—පහත සඳහන් වෛකල්පික විෂයයන්ගෙන් එකක් අපේක්ෂකයින් විසින් තෝරා ගත යුතුය. විශේෂයෙන්ම ලංකාව ආශ්‍රිතව සකස් කරනු ලබන මෙම වෛකල්පික ප්‍රශ්න පත්‍රයට කාලසීමාව පැය දෙකකි. මෙම ප්‍රශ්න පත්‍රයේ විෂය ප්‍රමාණයට වැටෙන ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා සංයුක්ත මණ්ඩලවල ක්‍රියාකාරීත්වය හා ගැටළු පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කර බැලීම සඳහා මෙකී ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත:— 100

1. කර්මාන්ත, වෙළඳ හා වාණිජ කටයුතු
2. මහජන මුදල්
3. කෘෂිකර්මය හා සමුපකාරය
4. වත්මන් ලංකාවේ ආණ්ඩුක්‍රමය
5. අධ්‍යාපනය හා සංස්කෘතික කටයුතු
6. සෞඛ්‍ය, කම්කරු හා සමාජසේවා
7. ගමනාගමනය හා මහජන සේවා
8. ලංකාවේ නීති ක්‍රමය සහ කොන්ත්‍රාත් හා සිවිල් වැරදි පිළිබඳ නීතිය හෝ පුද්ගලයන් හා දේපල පිළිබඳ නීතිය
9. සාමාන්‍ය විද්‍යාව

සැලකිය යුතුය.—අපේක්ෂකයින්ට සහයක් වශයෙන්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු පහත සඳහන් වෛකල්පික විෂයයන් අනුව සාමාන්‍ය වශයෙන් බෙදා ඇත :—

(1) **කර්මාන්ත, වෙළඳ හා වාණිජ කටයුතු.**—වාණිජ, ආනයන අපනයන, කර්මාන්ත, වෙළඳ නැව්, භූවිද්‍යා සමීක්ෂක, ලුණු, වෙළඳ සමාගම් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්, දේශ සංචාරක කාර්‍ය්‍යාංශය, ධීවර, කුඩා කර්මාන්ත යන දෙපාර්තමේන්තු.

(2) **මහජන මුදල්.**—භාණ්ඩාගාරය, ආණ්ඩුවේ ගබඩා, දේශීය ආදායම්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන, ජාතික ක්‍රම සම්පාදන, විශ්‍රාම වැටුප්, මහජන නය මුදල්, නය මණ්ඩලය, ආණ්ඩුවේ මුද්‍රණාලය, ජාතික මුදල් ඉතිරිකිරීම, අර්ථ සාධක අරමුදල්, රේගු යන දෙපාර්තමේන්තු.

(3) **කෘෂිකර්මය හා සමුපකාරය.**—ඉඩම්, මැනුම්, වන සංරක්ෂණ, වාරිමාර්ග, වනසත්ව, සත්වෝද්‍යාන, කෘෂිකර්ම, ආහාර, සමුපකාරය, ගොවිජන සේවා, අලෙවි කිරීම, පොල් වැවීම නඟා සිටුවීම, තක්සේරු යන දෙපාර්තමේන්තු.

(4) **වත්මන් ලංකාවේ ආණ්ඩුක්‍රමය.**—කැබිනට් කාර්‍ය්‍යාලය, උත්තර මන්ත්‍රණ සභාව, මහජන මන්ත්‍රී මණ්ඩලය, ගණන් පරීක්ෂක, මැතිවරණ, ප්‍රාදේශීය පාලන, පළාත් පාලන, ග්‍රාම සංවර්ධන, උඩරට ගැමි කොමිෂන් සභාව, නගර හා ග්‍රාම නිර්මාන, රෙජිස්ට්‍රාර් ජනරාල්, පොලීසිය, සුරාබදු, විදේශ කටයුතු, ආගමන හා විගමන, සන්නද්ධ සේවා යන දෙපාර්තමේන්තු.

(5) **අධ්‍යාපනය හා සංස්කෘතික කටයුතු.**—අධ්‍යාපන, කාර්මික විද්‍යාල, විභාග, කාලගුණ විද්‍යා, ශ්‍රී ලංකා ජාතික කලායතනය, සංස්කෘතික කටයුතු, රාජ්‍ය ලේඛනාරක්ෂක, ජාතික කෞතුකාගාර, පුරාවිද්‍යා, මූලික අභ්‍යාස කාර්මික ආයතනය, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති යන දෙපාර්තමේන්තු.

(6) **සෞඛ්‍ය, කම්කරු හා සමාජ සේවා.**—සෞඛ්‍ය, නිවාස, ආයුර්වේද, කම්කරු, සමාජසේවා, පරිවාස හා ළමාරක්ෂක සේවා, බන්ධනාගාර යන දෙපාර්තමේන්තු.

(7) **ගමනාගමනය හා මහජන සේවා.**—රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ, මෝටර් රථ, දුම්රිය, සිවිල් ගුවන් සේවා, වරාය කොමිෂම, වෙරල ආලෝක, ජලසම්පාදන හා ජලාපවහන සහ විදුලිබල යන දෙපාර්තමේන්තු.

(8) **ලංකාවේ නීති ක්‍රම**—උසාවි, පිස්කල්, සහනදායක මණ්ඩල, අල්ලස් කොමසාරිස්, ආණ්ඩුවේ රසපරීක්ෂක, මහා භාරකරු යන දෙපාර්තමේන්තු සහ මුස්ලිම් දේවස්ථාන හා පුණ්‍යාධාර භාරකාර මණ්ඩල.

**(ආ) කොටස—සුදුසුකාවය**

**(අ) ලංකා පරිපාලන සේවයේ 10 වැනි ඡෙදයේ සඳහන් තරඟ පාය පරීක්ෂණය**

ලංකා පරිපාලන සේවයේ V වැනි පන්තියේ අවුරුදු 5 කට නො අඩු සේවා කාලයක් ඇති හා රුපියල් 5,880 ට හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන, V වැනි පන්තියේ I වැනි හා II වැනි ශ්‍රෙණිවල නිලධාරීන්ට මෙම පරීක්ෂණයට පෙනී සිටිය හැකිය. නිලධාරීන්ට අවස්ථා පහකට නො වැඩි ගණනක් මෙම පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

**(ආ) 23 වැනි ඡෙදයේ සඳහන් සීමිත තරඟ පාය පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ඇති නිලධාරීන් මෙසේ ය.**

(1) ලංකා පරිපාලන සේවයේ, I වැනි පන්තියේ II වැනි ශ්‍රෙණියේ නිලධාරීන්.

(2) වර්ෂයකට රුපියල් 2,820 ට නො අඩු වැටුපක් ලබන හා අවුරුදු 15 ක සේවයක් ඇති පහත සඳහන් සාමාන්‍ය ලිපිකාර සේවයේ හා අනිකුත් ලිපිකාර සේවාවල නිලධාරීන්.

(3) පහත සඳහන් දෙපාර්තමේන්තු ශ්‍රෙණිවල අවුරුදු 10 ක සේවයක් ඇති නිලධාරීන්.

මෙම පරීක්ෂණයේ දී තරඟ කිරීමට අන් කවර නිලධාරියෙකුට හෝ අවසර දීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

නිලධාරියෙකුට අවස්ථා පහකට නොවැඩි ගණනක් මෙම පරීක්ෂණයට පෙනී සිටිය හැකි ය.

**ලිපිකාර සේවා—**

1. සාමාන්‍ය ලිපිකාර සේවය
2. තැපැල් ලිපිකාර සේවය
3. දුම්රිය ලිපිකාර සේවය
4. රේගු ලිපිකාර සේවය
5. කොළඹ විදුලි බල සැපයීමේ ලිපිකාර සේවය
6. විදුලි දෙපාර්තමේන්තු ලිපිකාර සේවය
7. ලංකා මුදල් ඉතිකිරීමේ බැංකුවේ ලිපිකාර සේවය
8. රබර් පාලක ලිපිකාර සේවය
9. තේ පාලක ලිපිකාර සේවය
10. ආණ්ඩුවේ මුද්‍රණ ලිපිකාර සේවය
11. ආරෝග්‍යශාලා ලිපිකාර සේවය
12. අධ්‍යාපන ලිපිකරුවන්
13. වරාය ඉංජිනේරු ලිපිකාර සේවය

**අනිකුත් දෙපාර්තමේන්තු ශ්‍රෙණි**

| | දෙපාර්තමේන්තුව | තනතුර |
|---|---|---|
| 1. | ගොවිජන සේවා ... ... ... | ප්‍රාදේශීය නිලධාරීන් |
| 2. | සමාජ සේවා ... ... ... | මහළුන් හා දුබලයන් සඳහා වූ රජයේ නිවාසවල අධිකාරීන්, සමාජ සේවා නිලධාරීන් |
| 3. | සමූපකාර ... ... ... | සමූපකාර සමිති පරීක්ෂකවරුන් |
| 4. | රේගු ... ... ... | තැපැල් තක්සේරුකරු, ප්‍රධාන සහකාර තක්සේරුකරුවන්, ප්‍රධාන සහකාර ගාස්තු නිලධාරීන්, ප්‍රධාන සහකාර නිවාරණ නිලධාරීන් |
| 5. | විභාග ... ... ... | සහකාර විභාග අධිකාරීන් |
| 6. | කම්කරු ... ... ... | කම්කරු නිලධාරීන්, රැකීරක්ෂා කාර්යාලයේ කළමනාකරු, වේතන මණ්ඩල ලේකම් |
| 7. | පළාත් පාලන ... ... ... | රු. 2,820 ට නොඅඩු වාර්ෂික වැටුප් ලබන හා අවුරුදු 10කට නොඅඩු සේවයක් ඇති පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මාරුකිරීම් රහිත සේවාවල නිලධාරීන්, පරීක්ෂකයින්, ගම්බද වැඩ අධිකාරීන්, විමර්ශන නිලධාරීන් |
| 8. | අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව ... ... | වෙළෙඳ හා අලෙවි කිරීම් ගැටළු පිළිබඳ විශේෂ දැනුමක් හා පළපුරුද්දක් ඇති රු. 2,820ෙය් වාර්ෂික වැටුපට පැමිණ ඇති හෝ අවුරුදු 10ක පළපුරුද්දක් ඇති අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ප්‍රාදේශීය අලෙවි කිරීමේ නිලධාරීන්, අලෙවි කිරීමේ නිලධාරීන්, කළමනාකරුවන් |
| 9. | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත ... | ජේෂකර්ම සහකරුවන්, ජ්‍යෙෂ්ඨ ග්‍රාම සංවර්ධන සහකරුවන්, කර්මාන්ත සහකරුවන්, ග්‍රාම සංවර්ධන සහකරුවන් |
| 10. | ආහාර ... ... ... | ආහාර හා මිළපාලක පරීක්ෂකවරුන්, වාමස් ධාන්‍යාගාරයේ නිවාරණ නිලධාරීන් ධාන්‍ය සමීක්ෂක. |
| 11. | ඉඩම් කොමසාරිස් ... ... | ජනපද නිලධාරීන්, ඉඩම් කට්ටි පරිපාලකයින්, කච්චේරි මිනින්දෝරුවන් |
| 12. | මෝටර් රථ ගමනාගමන ... ... | මෝටර් රථ පරීක්ෂකයින් |
| 13. | භාණ්ඩාගාරය ... ... ... | විමර්ෂණ නිලධාරීන් |

1–814—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

---

**භාණ්ඩාගාරයේ අංකය : 1/83/12/1(ජී).**

## සථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ සේවය සථිර කිරීමේ (ඉංග්‍රීසි) පරීක්‍ෂණය—1963 ජනවාරි

1963 ජනවාරි මස පවත්වන ලද සථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ ලඝු ලේඛකයන්ගේ සේවය සථිර කිරීමේ (ඉංග්‍රීසි) පරීක්‍ෂණයේ ප්‍රතිඵල නිකුත් කරමින් 1963 අප්‍රේල් මස 5 වැනි දින අංක 13,592 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ විභාග, විභාග ප්‍රතිඵල ආදිය යන ශීර්ෂය යටතේ පළ කළ සමාංකය හා 1963 අප්‍රේල් මස 1 වැනි දින දරන නිවේදනය සම්බන්ධවයි.

මෙම පරීක්‍ෂණය පවත්වන ලද දිනය 1963 ජනවාරි මස 18 යයි එම ගැසට් නිවේදනයේ සඳහන් වී ඇතත්, එය 1963 ජනවාරි මස 11 වැනි දිනය යි සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

1964 ජනවාරි 15 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

1–667—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ලංකා යුද්ධ හමුදාව

කොළඹ 1, සෙනට් මන්දිරයේ, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ටෙන්ඩර මණ්ඩලයේ සභාපතිතුමා විසින්, ලංකා යුද්ධ හමුදාවට **දැනට ඇති තොගවලින්/පිටරටින් ගෙන්වා ඩිස්ටෙම්පර්** සැපයීම සඳහා, 1964 පෙබරවාරි 7 වෙනි දින පෙරවරු 9.30 වන තුරු ටෙන්ඩර පත් බාරගනු ලැබේ.

ටෙන්ඩර ආකෘති පත්‍රයක් නිකුත් කිරීමට පෙර, කොළඹ, පහළ වැව පාරේ, යුද්ධ හමුදා මූලස්ථානයේ, සිවිල් පාලන නිලධාරී හා ගණකාධිකාරිතුමා වෙත රුපියල් සියයක (රු. 100) මුදලක් තැන්පත් කළ යුතුයි. පනාගොඩ, යුද්ධ හමුදා කඳවුරේ, ලංකා ඉන්ජිනේරු (කායර්‍ ෂේවා) ආඥපතිතුමාගෙන් 1964 පෙබරවාරි 6 වෙනි දින දවල් 12 වන තුරු ටෙන්ඩර ආකෘති පත්‍ර ලබා ගත හැකියි.

ටෙන්ඩර ඉදිරිපත් කළ යුත්තේ පිටපත් දෙකකින් යුතුව ය. ඒවා මුද්‍රා තැබූ කවරවල බහා ඉහළ වම් කෙළවරේ "ලංකා යුද්ධ හමුදාවට ඩිස්ටෙම්පර් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් ලකුණු කොට, කොළඹ 1, සෙනට් මන්දිරයේ, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ, ටෙන්ඩර මණ්ඩලයේ සභාපතිතුමා වෙතට ලිපිනය ලියා එවිය යුතුයි.

ටෙන්ඩර විවෘත කරනු ලබන්නේ උඩ 1 වෙනි ඡේදයේ සඳහන් කොට ඇති එම දිනයට හා වේලාවට එම ස්ථානයේ දී යි. සියළු ම ටෙන්ඩරකරුවනට නැතහොත් ඔවුන්ගේ නියයාකාර බලයලත් නියෝජිතයනට ටෙන්ඩර පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවේ දී පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩරයක් පරීක්ෂා කිරීමට කිසි යම් ටෙන්ඩරකරුවකුට සිත් වුනි නම්, ටෙන්ඩර මණ්ඩලයේ සභාපතිතුමා සමඟ පිළියෙල කර ගැනීමෙන්, ඉදිරිපත් කරන ලද කවර හෝ ටෙන්ඩරයක දෙවෙනි පිටපත පරීක්ෂාකර බැලීමට අවසර දෙනු ලැබේ.

අත්සන් කෙළේ :
මේජර් කේ. රාජනාදන්,
මේජර්-ජනරාල්,
යුද්ධ හමුදා ආඥපති වෙනුවට.

1–767—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වෙන්කලඩි උප කොට්ඨාශය

වැලිගහකන්ඩිය වැවේ ප්‍රධාන ඇලේ 1 සැතැප්ම නැතීම සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 18 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 47,100කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුලදී වෙන්කලඩි උපකොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 50 (පනහක්) ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එස්. රාජේන්ද්‍රම්,
වාරිමාර්ග ඉංජිනේරු,
වෙන්කලඩි උප කොට්ඨාශය.

වෙන්කලඩි.
1964.1.9.

1–805/1—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වෙන්කලඩි උප කොට්ඨාශය

1. වැලිගහකන්දේ වැවේ—ප්‍රධාන ඇලේ 2 සහ 3 නැතීම සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 18 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 24,950කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී වෙන්කලඩි උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වේන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇස්. රාජේන්ද්‍රම්,
වාරිමාර්ග ඉංජිනේරු,
වෙන්කලඩි උප කොට්ඨාශය.

වෙන්කලඩි,
1964.1.9.

1–805/2—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වෙන්කලඩි උප කොට්ඨාශය

1. උන්නිච්චායි ව්‍යාපාරයේ වම් ඉවුරේ දැනට ඇති වානට උඩින් පාලමක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 18 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 18,400කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුලදී වෙන්කල්අඩි උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයැදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියළුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එස්. රාජේන්ද්‍රම්,
වාරිමාර්ග ඉංජිනේරු,
උප කොට්ඨාශය.

වෙන්කලඩි,
1964.1.9.

1–794—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—වවුනිකුලම උප කොට්ඨාශය

වවුනිකුලම උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 18 වෙනි අඟහරුවාද පෙරවරු 10 දක්වා වවුනියාවේ උතුරු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ.

| වැඩෙහි නම | ලියා පදිංචි කළ මුදල රුපියල් | | තැන්පත් මුදල රුපියල් |
|---|---|---|---|
| වවුනිකුලම ව්‍යාපාරයේ වම් ඇලේ සැතැ. 3 සෑදීම | 24,000 | ... | 50 |
| වවුනිකුලම ව්‍යාපාරයේ වම් ඇලේ සැතැ. 4 සෑදීම | 36,000 | ... | 50 |
| වවුනිකුලම ව්‍යාපාරයේ දකුණු ඇලෙහි අංක 9 දරණ අතු ඇල සෑදීම ... ... | 33,000 | ... | 50 |

2. 1964 පෙබරවාරි මස 14 වෙනි සිකුරාද වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුල දී ඔඩ්ඩුසුට්ටාන් හි පිහිටා ඇති මූලත්තිවූ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරිමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරිමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරිමට ප්‍රථම රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

3. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

වී. බාල සුබ්‍රමනියම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
වවුනිකුලම උප කොටස.

වවුනිකුලම,
මානිකුලම, 1964 ජනවාරි මස 16 දින.

1–586—64.1.24 දින අංක 13,931 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කොළඹ උප කොටස

පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 18 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා කොළඹ 8, කෝට්ටේ පාරේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම සිදු කෙරේ.

| වැඩයේ නම | කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි විය යුතු ගණන |
|---|---|
| (1) රත්මලානේ රියැදුරන්ගේ සයනාගාරයක් තැනීම | රු. 24,000ට හෝ ඊට වැඩි ගණනකට |
| (2) දුම්මලදෙනිය සුළු ගංවතුර ආරක්ෂක යෝජනා ක්‍රමය තැනීම | රු. 28,000ට හෝ ඊට වැඩි ගණනකට |
